# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ
# <u>පුවත්පත් නිවේදනය</u>

## මහත්මා ගාන්ධිතුමාගේ 150 වන ජන්ම සංවත්සරය ශ්‍රී ලංකාවේදී සැමරේ

1. මහත්මා ගාන්ධිතුමාගේ 150 වන ජන්ම සංවත්සරය නිමිත්තෙන් එතුමාට උපහාර දැක්වීමේ විශේෂ වැඩසටහනක් 2019 ඔක්තෝබර් 1 වන දින කොළඹ, ජනාධිපති කාර්යාලයේදී පැවැත්විණ. මෙහිදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ ඉන්දීය මහ කොමසාරිස් ගරු තරංජිත් සිං සන්ධු මැතිතුමා මහත්මා ගාන්ධිතුමා වෙත පුෂ්පෝපහාර දැක්වීය.

2. මහත්මා ගාන්ධිතුමා හා ශ්‍රී ලංකාව අතර තිබූ ගැඹුරු සම්බන්ධතාවයක් තිබූ අතර 1927 වර්ෂයේදී එතුමා ශ්‍රී ලංකාව පුරා සිදු කළ සංචාරයෙන්ද එය වඩාත් හොඳින් පිළිඹිබු විය. එබැවින්, ගාන්ධි ජයන්තිය සෑම වර්ෂයකදීම ශ්‍රී ලංකාවේදී සැමරීම එතුමාගේ ජන්ම දිනය සැමරීමක් මෙන්ම එතුමා සහ ශ්‍රී ලංකාව අතර පැවති ගැඹුරු සම්බන්ධතාවය සැමරීමක්ද වේ.

කොළඹ
2019 ඔක්තෝබර් 1